# මීමන ප්‍රේමතිලක මතක

රත්තනදෙණියේ මේධානන්ද හිමි

කොළඹ යුගයේ දෙවන පරම්පරාවට අයත් කවියකු වූ මීමන ප්‍රේමතිලක මහතා හොරණට සමීප මීමන දී උපත ලබන්නේ 1918 සැප්තැම්බර් මස 20 දායි. හොරණ විද්‍යාරතන පිරිවෙනෙන් මූලික අධ්‍යාපනය ලැබූ ඔහු කොළඹ ආනන්ද විද්‍යාලයෙන්ද ද්විතීක අධ්‍යාපනය ලැබුවේය. කලාවට දැඩි කැමැත්තක් දැක්වූ මීමන ප්‍රේමතිලකයන් දිනමිණ පුවත්පතේ භාෂා පරිවර්තකයකු ලෙස වැඩභාර ගන්නේ 1936 ජූනි 16 වැනිදාය. ඒ වනවිට ඔහුගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමට ආසන්න වුවා පමණි. එහෙත් ඔහුගේ ලේඛන කුසලතාව නිසා ඔහුට වැඩ කරන්නට සිදුවන්නේ සිළුමිණ කර්තෘ මණ්ඩලයේ ය. උපන් ප්‍රතිභා වෙන් දක්ෂතා පෙන්වූ ඔහුට ලංකාදීප සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස මෙන්ම ජනතා පුවත්පතෙහි උප සංස්කාරක තනතුරද හිමිවිය. පසුව ඔහු "සිළුමිණ" පුවත්පතේ ප්‍රධාන කර්තෘ ලෙසද සේවය කළේය. සරසවිය පුවත්පතේ ආරම්භක කර්තෘවරයාද ඔහු විය. භාෂා සාහිත්‍ය මෙන්ම පුවත්පත් කලාව පිළිබඳ හසල අවබෝධයක් ඇති එතුමා පුවත්පත් කලාවේ නැගිය හැකි ඉහළම ස්ථානවලට ගියේ දැනුම, හැකියාව සමග නිබඳ කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස ය.

කුඩා කාලයේදීම සාහිත්‍ය කලාවට සම්බන්ධ වූ මීමන ප්‍රේමතිලක බටහිර කවි කතා අනුවර්තනයේ දක්ෂයකු විය. 20 වන සියව සේ සිටම පරිවර්තකයකු බවට පත් වූ නිසා ඔහුගේ කාව්‍ය කෘති කිහිපයක්ම අනුවර්තන ප්‍රබන්ධ විය. "සොහොන්බිම"(1947) නමැති පද්‍ය කාව්‍යය ගැමි වහර ඉතා අපූරුවට උපයෝගී කර ගත් වැදගත් අනුවර්තන පද්‍ය කාව්‍යයකි. ඉංග්‍රීසි බස පිළිබඳ ද උසස් ප්‍රවීණතාවක් ලැබ සිටි මීමන ප්‍රේමතිලක බටහිර සාහිත්‍යයද ඇසුරු කළේය. නමුත් විරිතකින් තොර කවියක් නැතැයි තදින් විශ්වාස කළ ඔහු හැමවිටම සඳැස් කවිය රැකගැනීමට උත්සුක වූවේය. ඔහු සිංහල සාහිත්‍යට දායාද කළ ගද්‍ය, පද්‍ය නිර්මාණ හා පරිවර්තන කෘති රැසක් වෙයි. මිනිහා (1943) , මරණය (1943), පාළුගම (1948) ,මල්හාමි (1945), කිරිහාමි (1949) නිල්දියේ නළඟන, අන්ධ ළමයා, සුරපුර, එතෙර, අඹමල් ,නොනැසෙන සුන්දරී, ඊට නිදසුන් කීපයක් වෙයි. ගැමි ජීවිතයේ දුක්බර අංග තම නිර්මාණ වලට අත්දැකීම් ලෙස යොදාගෙන පාඨකයන්ට අවබෝධ කරගත හැකි පරිදි සරල බසින් කාව්‍ය රචනා කළේය. නිර්මාණයට පාදක වූ ඇතැම් වස්තු විෂයයන් බටහිර වුවද දේශීය පසුබිමට අනුකූලව තම නිර්මාණවලට ගත්තේය.ඇතැම් ඒවා ඔහු පරිවර්තනය කොට කාව්‍යප්‍රිය රසිකයන් වෙනුවෙන් පළකළේය. පෙරදිග පෙම් මැණික් කාව්‍ය සංග්‍රහය එසේ පරිවර්තිත කාව්‍ය සංග්‍රහ යකි. මෙබඳු ඉතිහාසීය දැවැන්ත ප්‍රතිරූප අද උසස් අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය පරපුරෙන් පිටුවහල් කර දැමීම මෙවන් මිනිසුන්ට කළ අසාධාරණයක් මෙන්ම බලවත් ශාස්ත්‍රීය අකටයුත්තක්ද වෙයි.



මුල් නමින් කරුණාදාස ප්‍රේමතිලක නම් වූ ඔහු මීමන ප්‍රේමතිලක ලෙස ගමේ නම මුලට ඈඳා ගනිමින් තමනුත්, මීමන ගමත් ඉතිහාසයට එකතුවන ලෙස ලේඛනයේ නියැළී, හරියටම මීට වසර 53 කට පෙර 1965 ජූලි මස 12 දා කොළඹ කනත්තේ ගිනිදැල් අතර සැගව ගියේය. මිය යනවිට ඔහු ජීවත්ව සිට ඇත්තේ වසර හතළිස් හතක් තරම් වූ කෙටි කාලයක්.

**මේ කෙටි සටහන ඒ මීමන ප්‍රේමතිලක නම් කොළොඹ කවියාගේ 53 වන ගුණානුස්මරණය නිමිත්තෙන්.**




